රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 25/94

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994 ජුලි මස 18 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන්,
රජයට අයත් සමාගම්වල සභාපතිවරුන් සහ
රජයට අයත් ව්‍යාපාරික ආයතන,
බැංකු හා මූල්‍ය ආයතන වල නිසි බලධාරීන් වෙත.

<u>පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය - කාර්ය මණ්ඩල අවශ්‍යතා</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක. 5/91 හා 1991.02.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

02. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලයේ නිරත කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/සංස්ථා/සන්නද්ධ සේවා/බැංකු/මණ්ඩල හා ස්වේච්ඡා සංවිධාන වලින් ලබා ගත් විවිධ නිලධාරීන්ගෙන් සමන්විතය. රජයේ අවශ්‍යතා මත මෙසේ අනුයුක්ත කරන ලද මෙම නිලධාරීන් නැවත ආපසු සිය ආයතන වෙත ලබා දෙන ලෙස ඉල්ලීම් ලැබෙමින් පවතී. ඇතැම් දෙනෙකුගේ වැටුප් ගෙවීම ද සමහර ආයතන විසින් නවත්වනු ලැබ ඇත. මේ අනුව පුනරුත්ථාපන කොමාසාරිස් ජනරාල් කාර්යාලයේ වැඩ කටයුතු කර ගෙන යාම ද අසීරු වී ඇත.

03. රජයේ අවශ්‍යතාවය අනුව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්ගේ කාර්යාලය ආරම්භ කළ දිනය වන 1990.01.03 දින සිට එය වසා දමනු ලබන දිනය තෙක් එකී කාර්යාලයේ සේවයෙහි යොදවා ගනු ලබන විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/පළාත් පාලන ආයතන/සංස්ථා/ සන්නද්ධ සේවාවන්/මණ්ඩල/බැංකු හා වෙනත් සියළුම රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයන්ට ඔවුන් එසේ කොමසාරිස් ජනරාල්ගේ කාර්යාලයේ සේවය කරන කාලය තුළ සිය සේවාවන්හි හිමි විය යුතු වැටුප්, වැටුප් වර්ධක හා අනෙකුත් දීමනා ද, උසස්වීම් ආදිය ද හිමිකම් ඇත. වෙනත් වරප්‍රසාද ආදියත් වෙතොත් ඒවා ද අදාළ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/සස්ථා/සන්නද්ධ සේවාවන්/මණ්ඩල/ බැංකු හා වෙනත් රාජ්‍ය අංශයේ ආයතන වලින් ම ලබා දීමට ක්‍රියා කළ යුතුයැයි රජය තීරණය කර ඇත. ඒ අනුව ක්‍රියා කරන්න.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.